# දමා යන්නට

ගීය රසිකයින් අතරට සන්නිවේදනය වෙන්නේ සෞම්‍යව, තැන්පත්ව මිහිරෙන් ගායනා කරන සෝමතිලක ජයමහ ප්‍රවීණ ගායන ශිල්පියාණන්ගේ හඬින්. කවදත් අර්ථවත් පද රචනා ඉතා ම ප්‍රවේශමෙන් තෝරාගෙන ගායනයට යොමු වෙන ජයමහ ශිල්පියාණන්ගේ ගායනය මේ ගීය ගායනයේදී වඩාත් භාවාත්මක වී ඇති සේ හැඟෙයි. ඒ සිය ආදරණීය බිරිඳ සමඟ ආදරයෙන් සිය මැදි විය ඉක්ම වූ විවාහ ජීවිතය ගත කරනා වැඩිහිටියෙකුගේ මනෝභාවයන්ගේ පළයක් ලෙසින්. ජීවිතයෙන් ලද පරිචයෙන් මුහුකුරා ගිය සිත් සතන් ඇතිව අර්ථ පූර්ණ, රස පූර්ණ නිර්මාණ වෙනුවෙන් සිය දායකත්වය හෙළ ගී කෙතට කවදත් ලබාදෙන සෝමතිලක ජයමහ ශිල්පියාණන්ගේ තවත් වටිනා ගායනයක් 'දමා යන්නට' ගීතය.

2020 වසරාවසානයේ සමවදින්නට මේ ගීය සුදුසු ලෙස ගැනුනේ ගෙවෙන්නා වූ වසර පුරාවට අනිත්‍ය පිළිබඳව සිතීමට සිදු වූ නිසාවෙන්.

**දමා යන්නට නො හැකි මිහි මත**
**එක ම සම්පත ඔබ ම පමණයි**
**මිදී යන්නට නො හැකි මේ ලොව**
**එක ම බැඳුම ද ඔබ ම පමණයි.**

**බැඳී දුක සැප දෙකෙහි නිතියෙන්**
**හදේ තනි නො තනියට වැඩ හුන්**
**ල බැඳි සිත් මල් පරව යන විට**
**පසක් වෙයි අනියත ලොවේ**
**ජීවිතය යනු සිහිනයක් ම ය**
**සසර මඟ රකිනා......**

**බැඳුණු සෙනෙහස නො වන නිම් හිම්**
**ඇත ද පණ නළ සමඟ රැකෙමින්**
**අපේ අත්වැල ලිහී ගිලිහෙන**
**මොහොත එයි කවදා හෝ**
**යා යුතුය ඒ නියත නික්මන**
**සියළු බැම් සිඳිනා.............**

*ගායනය:*
සෝමතිලක ජයමහ

*තනුව හා සංගීතය:*
ආචාර්ය රෝහණ වීරසිංහ

*රචනය:*
කුලරත්න ආරියවංශ



තාරුණ්‍යයේ පොපියන චමත්කාරයෙන් වශීකෘතව සිටිනා ආදරවන්තයින්ට අනුව නම් 'ආදරය' යනු යෞවනයට පමණක් ම සීමා වූවක්. නැවුම් සිතුවිලිවලින් පිබිදුන යොවුන් ජවය කැවුන උණුසුම් රුහිරයෙන් යුත් තාරුණ්‍යය ප්‍රේමයේ ආහ්ලාදයෙන් මන් මත්ව සිය ජීවිතවල වසත් සමය ගත කරත්. එ ද ජීවිතය දිනෙන් දින ගෙවී යන සඳ වියපත් වෙන ඔවුන්ගේ සිතුවිලි මුහුකුරා යන නියාව සිතා ගන්නට බැරි තරම්. ජීවිතයේ අනිත්‍ය බව පසක් කරගතන්නට නම් යොවුන් විය මතු නො ව ඇතැම් විට මැදි විය ද පසු කරන තෙක් අපහසුයි.

හෙළ ගී කෙතේ පද රචනා අතරට ආදරණීය ම නිර්මාණ එක් කළ නිබන්ධකයින් දෙදෙනා අතරට එක් වන කුලරත්න ආරියවංශ ප්‍රවීණ නිබන්ධයාණන්ගේ 'දමා යන්නට' ගීය පිළිබඳවයි යට ලියැවුණු පූර්විකාව. ආදරණීය වදන්වලින් ආදරණීය තේමාවන්ට අනුව ආරියවංශයන්ගේ අතින් පබැඳුන දහසකුත් එකක් ගී අතරට 'දමා යන්නට' පද රචනාව එක් වන්නේ මැදි විය ඉක්ම වූ ආදරවන්ත අඹුසැමි යුවලකගේ සිතුවිලි පිළිබඳව රසිකයින්ගේ අවධානය යොමු කරවා ගනිමින්. ආදරණීය වදන් පෙළගන්වන්නට නම් ආදරණීය හැඟුම් උතුරා යන සිතක් ඇති ආදරවන්තයෙකු ම විය යුතුයි, නිබන්ධකයාත්. ඒ ආදරණීයත්වය දෙමව්පියන්ට හොර රහසේ පෙම් පුරනා සමයට පමණක් සීමා නො වී, විවාහ ජීවිතයේදීත් අනතුරුව වියපත් ජීවිතයේදීත් එක ලෙසින් ම රඳවා ගන්නට හැකි නම් එයයි වටිනාකම. ඒ අතින් බලන කල කුලරත්න ආරියවංශයන් ඉහළ ම තැනෙක සිටිනා බව පසක් කරවන ගී පද රචනාවකි මේ.

මේ පොළොව මත දමා යන්නට නො හැකි එක ම සම්පත ඇය ම පමණයි, මේ ආදරණීය සැමියාට. තම ප්‍රිය බිරිඳ සමඟ බැඳුන බැඳීමෙන් වෙන් ව යා නොහේ, සැමියාට. එය මිදී යා නො හැකි බැඳීමක්.

දුක-සැප දෙකේදී ම නිරන්තරව ම හදවතේ වැඩ හුන් ළබැඳි ඇය මලක් සේ ය, සැමියාට. මලක් වන් ඇයගේ පිවිතුරු, සුවඳවත් සිත දිනෙන් දින වියපත් වෙමින් පරව යන බවයි සැමියාට හැඟෙන්නේ. එවිටය ලොවේ ඇති අනියත බව ඔහුට පසක් වෙන්නේ. නිවන් දක්නා තුරුම අප බවයෙන් බවයට යන සසර ගමනේ, ඒ මග රැකගෙන සිටිනා අනිත්‍ය සිහිනයක් විතරක් මයි ජීවිතය.

තමන්ගේ පණ නළ රැකෙන්නේ ඇයගේ නිමක් ඉමක් නැති සෙනෙහස නිසාවෙන් බවයි සැමියාට වැටහෙන්නේ. එහෙත් මේ බැඳුන අත්වැල ලිහී ගිලිහෙන මොහොත කවදාක හෝ එන බව ස්ථිරයි ඔහුට. සැබැවින්ම මරණය යනු ජීවිතයට උරුම, නියත නික්මී යාමක්. තමන්ගේ ප්‍රියයන්ගෙන් මිදී නියත වශයෙන් ම යා යුතු වන නික්ම යාමක්. අප අතරේ ඇති සියළුම බැඳීම් සිඳ බිඳ යා යුතු වන නික්ම යාමක් මේ.

මේ ආදරවන්ත සැමියාට දමා යන්නට නො හැකි එක ම සම්පත වෙන්නේ සිය බිරිඳ පමණක් ම යි. උපන් දා සිට මවගේ පටන් කොතෙක් අය ඇසුරේ සිටිය ද, වියපත් වන විට සැමියෙකු ළඟින් ම රැඳී සිටින්නේ බිරිඳයි. බිරිඳකගේ කතාව වන්නේත් එය මයි. මිදී යන්නට බැරි එක ම බැඳීම වන්නේත් මේ අඹු-සැමි බැඳීමයි.

මේ අගනා පද පෙළට ඉතා ම සෞම්‍ය, හැඟීම් බර තනුවක් නිර්මාණය කළේ ආචාර්ය රෝහණ වීරසිංහ ප්‍රවීණ සංගීතවේදියාණන්. මැදි විය ඉක්ම වූ සංගීතවේදියෙකු ලෙසින් මේ තනුවට වීරසිංහයන් සිය භාවයන් එක් කරවා ඇත්තේ සිය සිතුවිලි ධාරාවන්ගේ ප්‍රකම්පනයෙන්. ඒ ප්‍රකම්පනයේ රිද්මය මයි සංගීත රටා පෙළ ගන්වන රිද්මය වන්නේත්. සිතාරය, ගිටාරය, බටනළා ඕබෝ භාණ්ඩය ඇසුරින් ස්වර හඬවන සංගීත රටාවලට රිද්මය කවන්නේ තබ්ලාවන්, පර්කෂන් වගේ ම බටහිර තාල වාද්‍ය කට්ටලයක් ද එක්ව.



**සිසිර දිසානායක**